# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/24 - 2017 සැප්තැම්බර් මස 27 වැනි බදාදා - 2017.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/02/2007.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.12.02 දිනැති හා අංක 1682/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.19 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හෙම්මාතගම, පල්ලිපෝරුව, අරඹේගෙදර හි පදිංචි පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,  
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩ බලන).

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,  
කොළඹ 05,  
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

කොළඹ කාර්මික අධිකරණයේ දීය

පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න,  
අරඹේගෙදර,  
පල්ලිපොරුව,  
හෙම්මාතගම

*නඩු අංකය* : ඒ 3363

*ඉල්ලුම්කරු*

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,  
අංක 200,  
කිරුළ පාර,  
කොළඹ 05.

*වග උත්තරකරු*

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

**තීන්දුව හා ප්‍රදානය**

ඉහත අංක දරන කාර්මික ආරවුල සම්බන්ධයෙන් කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා එතුමාගේ අංක IR/22/02/2007 සහ 2010.11.19 දිනැති ලිපිය මගින් පහත නම් සඳහන් මා බේරුම්කරු වශයෙන් පත් කරන ලදී.

2. මෙම ආරවුලට අදළුව නිකුත් කන ඇති කම්කරු කොමසාරිස්ගේ 2010.11.10 දිනැති ලිපියෙන් ඉහත කී පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ එවකට සීමාසහිත සබරගමුව බස් සමාගම යටතේ පාලනය වූ මාවනැල්ල ඩිපෝවේ සේවය කරමින් සිටියදී 2004.12.20 වැනි දින සිට 2005.12.31 වැනි දින දක්වා වැඩ තහනම් කරනු ලැබූ පී. ජී. ලක්ෂ්මන් ගුණරත්න

1 A – G 26314— 14 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මහතාට එම කාලසීමාව සඳහා නොගෙවන ලද අඩ වැටුප් ලබාදී ඒ අනුව ඔහු අඛන්ඩව සේවය කළ සේවකයෙකු ලෙස සලකා කටයුතු කරන ලෙස ඔහු විසින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙතින් කරන ඉල්ලීම යුක්ති සහගතද යන්න, යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ යනුවෙන් දක්වා ඇත.

3. මෙම කාර්මික ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවයේ ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු අවස්ථා දෙකකදී වග උත්තරකාර පාර්ශවය මෙම ආරවුල සම්බන්ධයෙන් සමථයක් ඇති කිරීමේ හැකියාව ඇති බවට යෝජනා කරන ලදින් ඒ අනුව බේරුම්කරණය විසින් ඊට අවස්ථාව ලබාදෙන ලදී. එහෙත් එම අවස්ථා දෙකෙහිදිම දෙවන පාර්ශවය බේරුම්කරණය හමුවේ සමථයක් නොමැති බව ප්‍රකාශ කරන ලදින් නඩුව විභාගයට ගැනීමට සිදුවිය.

4. ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවයට නඩුව ආරම්භ කරන ලෙස නියෝග කරන ලදින් ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු වෙනුවෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශයේ කම්කරු නිලධාරි එස්. ජී. නිමල් රෝසා යන අයවළුන් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී එ 1 සිට එ 12 දක්වා ලේඛණ සලකුණු කරමින් තම නඩුව අවසන් කරන ලදී.

5. අනතුරුව වගඋත්තරකාර පාර්ශවයට නඩුව ආරම්භ කරන ලෙස බේරුම්කරණය විසින් නියෝග කරන ලදින් ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් මාවනැල්ල ඩිපෝවේ ධාවන කළමණාකාර පල්ලෙගෙදර දුරයලාගේ විජේසේකර ආරක්ෂක නිලධාරි ජවරංගේ චන්ද්‍ර රණසිංහ යන අයවළුන් සාක්ෂියට කැඳවමින් නඩු විභාගයේදී R 1 සිට R 6 දක්වා වූ ලේඛණ ලකුණු කරමින් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කිරීමට 2014.10.27 වැනි දින ලබාදෙන ලදී. එහෙත් එකී දිනයෙන් පසුව 2014.10.27 දතමින් වගඋත්තරකරුගේ ලිඛිත දේශන ගොනුකර ඇති අතර 2004.12.01 වැනි දින හෝ ඊට පෙර ඉල්ලුම්කරුගේ ලිඛිත දේශණ ඉදිරිපත් කරන ලෙසට බේරුම්කරණය විසින් නියෝග කළද, ඉල්ලුම්කාර පාර්ශවය විසින් තම ලකුණු කළ ලේඛන සමග ලිඛිත සැලකිරීම් 2014.12.16 දතමින් ගොනුකර ඇත.

6. අනතුරුව මෙම නඩුවේ නියෝගය හා ප්‍රදනය සකස් කිරීම සඳහා බේරුම්කරණය විසින් කටයුතු කිරීමේදී මෙම ආරවුලට අදළව නිකුත් කර ඇති යොමුවේ දක්වෙන පරිදි දෙපාර්ශවය විසින්ම සාක්ෂි මෙහෙයවා නොමැති බව අනාවරණය වූයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ (සංශෝධිත) 31 (සී) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව නඩුව යළිත් විවෘත කර සාක්ෂි ලබා ගැනීමට බේරුම්කරණය විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2016.03.08 වැනි දින නඩුව කැඳවන ලදින් එදින වගඋත්තරකාර පාර්ශවයේ නඩුවට සූදනම්ව නොපැමිණීම නිසා 2016.03.29 වැනි දිනට නඩුව කල් තබන ලදී. 2016.03.29 වැනි දින නඩු විභාගය පවත්වන ලද අතර එදින ඉල්ලුම්කාර පන්දක්කාර ගෙදර ලක්ෂ්මන් ගුණරත්න යන අය සාක්ෂි දෙන ලද අතර එදින මෙම නඩුවේ නියෝගයෙන් පසු A 3218 නඩුවේ නියෝගයේ දී ලබාදෙන බව දෙපාර්ශවයටම දැනුම්දුන් අතර මෙම නඩුවට අදළව ඉදිරිපත් කරන ලේඛන ලැයිස්තුවක් සමග ඉදිරිපත් කරන ලෙසට දෙපාර්ශවයටම දැනුම් දෙන ලදී. 2016.10.09 වැනි දින අධිකරණය හමුවේ මෙම නඩුවේදී සාක්ෂි මෙහෙය විය යුතු සටහන අතුළත් කාර්මික අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ 2015.12.21 වැනි දින දරන ලිපිය දෙපාර්ශවයටම ලැබී නොමැති බවට ප්‍රකාශ කරන ලදින් ඒ අනුව එකී ලිපියේ පිටපත් දෙපාර්ශවයටම ලබාදෙමින් නඩුව 2016.12.15 වැනි දිනට කල් දමන ලදී. 2016.12.15 වැනි දින ඉල්ලුම්කරුගේ මූලික සාක්ෂි වැඩිදුරටත් මෙහෙයවන ලද අතර හරස් ප්‍රශ්න සඳහා 2017.01.26 වැනි දිනට කල් දමන ලදී. 2017.01.26 වැනි දින රජයේ නීතිඥ දවින්ද්‍ර ප්‍රනාන්දු මහත්මිය වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටිමින් මෙම ඉල්ලුම්කරුට 2004.12.30 වැනි දින සිට 2005.12.30 වැනි දින දක්වා ගෙවා ඇති අඩ වැටුප රු. 48,480ක් බවත් ඉතිරි හිග වැටුප ගෙවීමට ඇති බවටත් පිළිගෙන ඇත.

7. අනතුරුව නඩුව 2017.03.07 වැනි දිනට කල් දමා ඇති අතර එදිනට ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම මත නැවත ප්‍රශ්න සඳහා අවසාන වශයෙන් අවසාන දිනයන් බවට නියම කරමින් ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම මත දින ලබා දී ඇති අතර 2017.03.07 වැනි දින ඉල්ලුම්කරු පැමිණ නැති අතර ඔහු වෙනුවෙන් නියෝජනයක්ද තිබී නැත. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥ මහත්මිය කලාවරෝධි ආඥපනතේ 9, 10 වගන්ති යටතේ වැටුප් අහිමි කිරීම සම්බන්ධව නඩුවක් පවරනවානම් එය වර්ෂ 2 කාලයකදී පැවරිය යුතු බවත් නමුත් මෙම ඉල්ලුම්කරු 2004.12.30, 2005.12.31 යන කාල සීමාවේ දී වැටුප් සම්බන්ධයෙන් කරන ඉල්ලීමේදී මෙම අධිකරණයේදී 2010.11.19 පවරා ඇති බැවින් කාලාවරෝධි වී ඇති බැව් ප්‍රකාශ කර ඇත. එහෙත් අධිකරණය විසින් මෙම නඩුවේ යොමුව කර ඇත්තේ කම්කරු කොමසාරිස්වරයා විසින් 2010.11.10 වැනි දින වන බැවින් කාලාවරෝධි ආඥපනත බලපානවාද නැත්ද යන්න බව මෙම අවස්ථාවේදී නිගමනය කළ නොහැකි බව දක්වා ඇතත් කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවය මෙම ඉල්ලුම්කරුට රු. 48,480 මුදලක් ගෙවීමට ඇති බව 2017.01.26 වැනි දින හරස් ප්‍රශ්න අවසානයේදී පිළිගෙන ඇති, බැවින් ඉහත කී මූලික විරෝධතාවය 2017.03.07 වැනි දින ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වුවත් ලිඛිත දේශන ගොනු කරන ලෙසට 2017.04.26 වැනි දින ලබාදී ඇත. ඒ අනුව දෙවන පාර්ශවය විසින් R 1 - R 5 දක්වා වූ ලේඛන සමග තම ලිඛිත සැලකිරීම් ගොනු කර ඇත. පළමු පාර්ශවය 2017.05.29 දතමින් A 1 - A 12 දක්වා වූ ලේඛන වල ඡායා පිටපත් සමග ගොනුකර ඇත.

එහෙත් එකදු පාර්ශවයක් හෝ බේරුම්කරණයේ නියෝගය පරිදි ලේඛන ලැයිස්තු ගොනුකර නොමැත.

7. *තීන්දුව හා ප්‍රදනය* :

7.1 මේ අනුව බේරුම්කරණය විසින් තීරණය කළ යුතුව ඇත්තේ මෙම බේරුම්කරණය හමුවේ දෙපාර්ශවය විසින් ඉදිරිපත් කළ ලකුණු කරන ලද ලේඛන හා සමස්ත වාචික සාක්ෂි සහ ලිඛිත සැලකිරීම් අනුව යොමුවේ දක්වෙන පරිදි ඉල්ලුම්කාර ලක්ෂ්මන් ගුණරත්න යන අයට 2004.12.20 වැනි දින සිට 2015.12.31 වැනි දින දක්වා කාලයට අදළව නොගෙවා ඇති අඩ වැටුප් හිමිවන්නේ ද යන්න සහ ඔහු අඛණ්ඩව සේවය කළ සේවකයෙකු ලෙස සලකා කටයුතු කරන ලෙස ඔහු විසින් ශ්‍රී ලංකා

ගමනාගමන මණ්ඩලය වෙතින් කරන ඉල්ලීම යුක්ති සහගත ද යන්න යුක්ති සහගත වන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවා ද යන්න පිළිබඳවය.

7.2 මෙම නඩුව සඳහා ඉල්ලුම්කාර පාර්ශවය විසින් ගොනු කර ඇති දිනයක් රහිත තම පළමු ප්‍රකාශය මගින් ඉල්ලුම්කරුට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව කරුණු දක්වා ඇත. පැ. 1 සිට පැ. 13 දක්වා ලේඛන ඒ සමග ලකුණු කර ඇත. ඉහත කී පළමු ප්‍රකාශයේ දැක්වෙන පරිදි සහ මෙම ගරු බේරුම්කරණය හමුවේ ලබා දී ඇති වාචික සාක්ෂි අනුව 2004.12.30 වැනි දින සිට 2005.12.30 වැනි දින දක්වා අඩ වැටුප් ගෙවා ඇති අතර ඉතිරි අඩ වැටුප වන රු. 48,840 ලැබීමට ඇති බව ප්‍රකාශ කර ඇත. ඒ බවට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත A 8 වශයෙන් ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇත. එකී ලිපිය මගින් ඉතිරි අර්ධ වේතනය ද නඩු දිනවලට පෙනී සිටි දිනයන් සඳහා රාජකාරි නිවාඩු ද බෝනස් ද අනිකුත් දීමනාද ඉල්ලා ඇත. එකී ලිපියේ A8E සහ A8F සලකුණු කරන ලද කොටස් මගින් මණ්ඩලයේ ප්‍රධාන නීති නිලධාරි විසින් ඉල්ලුම්කරු විෂමාචාර ක්‍රියාවක් කර නොමැති බවත් ඔහුට නොගෙවූ වැටුප් හා නිවාඩු ලබා ගැනීමට හිමිකම් ඇති බවත් ඒ අනුව කටයුතු කිරීම නීත්‍යානුකූල බවත් ඔහුගේ නිල මුද්‍රාව A8F වශයෙන් ලකුණු කර ඇත. එහෙත් මෙම කොටස් ඔප්පු කිරීමේ භාරයට යටත්ව ලකුණු කරන ලදින් ඒවා ඔප්පු නොවූ කොටස් වශයෙන් සලකන ලදී. A9 වශයෙන් ලකුණු කර ඇති අභියාචන සංශෝධිත ලිපිය මගින් මාස 12ක හිඟ අඩ වැටුප් ගෙවන ලෙස දන්වා ඇති අතර ඉල්ලුම්කරු වෙනුවෙන් ලකුණු කල A12 නැතහොත් වගඋත්තරකරු වෙනුවෙන් R3 වශයෙන් ලකුණු කරන ලද මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ 1131/06 දරන නඩු තීන්දුව මගින් ඉල්ලුම්කරුට පහර දුන්නා යැයි කියන විත්තිකරුවන්ට දඬුවම් ලබා දී ඇත.

7.3 මේ අනුව මෙම ඉල්ලුම්කරුට රු. 48,840ක නොගෙවා ඇති අඩ වැටුප් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ගෙවිය යුතු බවට මෙයින් නියෝග කරමි. එසේම මෙම මුදල මෙම තීන්දුව හා ප්‍රදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු එක් මසක් ඇතුළත කෑගල්ල සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවටද වගඋත්තරකාර පාර්ශවයට වැඩිදුරටත් නියෝග කරමි. එයින් පසු එම මුදල මෙම ඉල්ලුම්කරුට ලබා ගත හැකිය. මෙම වැඩ තහනම් කිරීමේ හේතුව මත ඉල්ලුම්කරු වැඩ තහනම් කළ දිනය වන 2004.12.30 වැනි දින දක්වා ඔහුට හිමි නිවාඩු ද ඔහුට හිමි බවට නියෝග කරන අතර ඒ සඳහා අදළ මුදල් ඉල්ලුම්කරුට ගෙවන ලෙස මෙයින් නියෝග කරමි. 2004/2005 යන වර්ෂවල ප්‍රසාද දීමනා සම්බන්ධයෙන් හා රාජකාරි නිවාඩු සම්බන්ධයෙන් ප්‍රදනයක් නොකරමි.

මා එසේ තීරණය කිරීමට හේතු නම්-

(*අ*) දෙපාර්ශවය විසින්ම පිළිගෙන ඇති වගඋත්තරකාර මණ්ඩලයේ විනය ව්‍යවස්ථාව අනුව අභියාචනා නියෝගය සංශෝධිත ලිපිය පරිදි කටයුතු කිරීම නිත්‍යානුකූල වීම, එකී ලිපිය ඉල්ලුම්කාර පාර්ශවය විසින් A9 ලෙස සලකුණු කර ඇත. (ගොනුවේ 194 පිටුව)

(*ආ*) වගඋත්තරකාර මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි රජයේ නීතිඥවරිය 2017.01.26 හරස් ප්‍රශ්ණ අවසානයේදී ඉහත කී අඩ වැටුප ගෙවීමට ඇති බව පිළිගැනීම මගින් සාක්ෂි ආඥපනතේ 115 වගන්තිය මගින් වගඋත්තරකාර මණ්ඩලය ප්‍රතිබන්ධනය වී තිබීම. (ගොනුවේ 234 පිටුව)

(*ඇ*) වගඋත්තරකාර මණ්ඩලයේ 2017.05.29 දිනැති ලිඛිත සැලකිරීම් මගින් මෙම ඉල්ලීම කාලාවරෝධී පනතේ 9/10 වගන්තිය යටතේ කාලාවරෝධී වී ඇති බව දක්වා ඇති නමුත් ඉහත කී කාලාවරෝධී මූලික විරෝධතාවය 2017.03.07 වැනි දින බේරුම්කරණය විසින් ප්‍රතික්ෂේප කර තිබීම. (ගොනුවේ 236 හා 237 දරන පිටු)

8. මෙය සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් හා ප්‍රදනයක් ලෙස මම සලකමි.

පී. දනන්සූරිය,
බේරුම්කරු.

වර්ෂ 2017ක් වූ ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

10 - 317